**ශීර්ෂය 255 - කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 255 - කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූලි 17 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනූරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණු බව.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) දේපල පිරියත හා උපකරණ

**දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2021 වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව 2021 දෙසැම්බර් 31 දිනට පැවති රු.8,777,578,248ක් වූ මූල්‍ය නොවන වත්කම් එකතු වටිනාකම 2022 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය ලෙස ඉදිරියට ගෙන එනු වෙනුවට එම දිනට සටහන් කර තිබුණු ආරම්භක ශේෂය රු.4,452,639,832ක් වූයෙන් රු.4,324,938,416ක වෙනසක් නිරීක්ෂණය විය. | මේ සම්බන්ධව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් මත නිවැරදි කරගෙන ඉදිරියට පවත්වාගෙන යාමට කටයුතු කරන බව. | ආරම්භක ශේෂයන් නිවැරදිව ඉදිරියට රැගෙන ආයුතුය. වර්ෂය තුල ආරම්භක ශේෂයට ගැලපීම් කරන්නේ නම් එම ගැලපීම් පැහැදිලිව හඳුනාගත හැකිවන පරිදි සිදු කළ යුතුය. |
| (ii) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දේපල පිරියත හා උපකරණ පිළිබඳ ප්‍රකාශයේ 2022 ජනවාරි 01 දිනට කෙරීගෙන යන වැඩ රු.5,807,786,770ක් සහ එයට සමාලෝචිත වර්ෂය තුල එකතු කිරීම් රු.61,094,600ක් හා ඉවත්කිරීම් ලෙස නිලමැදුර පරිපාලන සංකීර්ණ ගොඩනැගිල්ලට අදාල වටිනාකම රු.4,385,958,383ක් ගලපා තිබුණි. මෙම ඉවත්කිරීම සිදුකළ පසුවද කෙරීගෙන යන වැඩ ලෙස තවදුරටත් මූල්‍ය ප්‍රකාශනවල රු.1,482,923,047ක් දක්වා තිබුණද, එම කෙරීගෙන යන වැඩ පිළිබඳ විස්තරාත්මක උපලේඛනයක් විගණනයට ඉදිරිපත් නොවිය. තවද මෙම කාර්යාල ගොඩනැගිල්ලට අදාල වටිනාකම ගිණුම් පොත්පත්වලින් ඉවත් කළද, ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ වටිනාකම තවදුරටත් මෙම කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශනවල | නිල මැදුර සංකීර්ණය කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය භාරයේ පවතින රජය සතු ඉඩමක ඉදිකර ඇති බව එම රජයේ ඉඩම අමාත්‍යාංශය භාරයට පත්කරන අන්දම පිළිබඳව නීතිමය විධිවිධාන නොමැති බව. අමාත්‍යාංශ, කලින් කලට ස්ථාපිත වන රාජ්‍ය ආයතනයක් වන බැවින් එවැනි ආයතනවල නිශ්චල දේපළවල භාරකාරත්වය වෙනස් වීම පිළිබඳව නෛතික තත්ත්වයන් පැහැදිලි කර නොමැති බැවින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය භාරයේ මෙම ඉඩමේ වටිනාකම් ඇතුළත් කර ඇති බව. | ඉඩමේ අයිතිය දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගිණුම් යටතේද, ගොඩනැගිල්ලේ අයිතිය ස්වදේශ කටයුතු, පළාත් පාලන අමාත්‍යාංශය යටතේද පැවතීම මතභේදාත්මක තත්ත්වයක් බැවින් ගිණුම්වල සටහනක් මගින් හෙළිදරව් කිරීම සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඇතුළත්ව තිබුණි. | | |
| **(iii)** | මූල්‍ය නොවන වත්කම් පරික්ෂා කිරීමේදි අයිතිය ප්‍රාදේශිය ලේකම් කාර්යාල සතුවු තක්සේරු කරන ලද ඉඩම් සහ ගොඩනැගිලි මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයට ඇතුළත් කර නොමැති අවස්ථා මෙන්ම තක්සේරු කර නොමැති නිසා මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයට ඇතුළත් කර නොමැති අවස්ථාද නිරීක්ෂණය විය. මොරටුව හා පාදුක්ක ප්‍රාදේශිය ලේකම් කාර්යාලට අදාල තක්සේරු කරන ලද නිල සෙවන කාර්යාල 08 ක්ද පාදුක්ක ප්‍රාදේශිය ලේකම් කාර්යාලට අදාල තක්සේරු කර නොමැති ගොඩනැගිලි 03ක්ද නිරීක්ෂණය විය. | සිගාස් පද්ධතියට ඇතුළත් නොවූ බොරුපන සේවා පියස කාර්යාලය සහ ඉඩමේ තක්සේරු වටිනාකමවු රු.7,500,000ක් හා පාදුක්ක ප්‍රාදේශිය ලේකම් කාර්යාලට අදාල තක්සේරු කරන ලද නිල සෙවන කාර්යාල 07 ක වටිනාකම රු.12,467,993ක් සිගාස් වැඩසටහනට ඇතුලත් කරන බව හා තක්සේරු කර නොමැති ගොඩනැගිලි තක්සේරු කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය නොවන වත්කම් නිවැරදිව හදුනාගෙන ගිණුම් ගත කිරිම සිදු කළ යුතුය. |

## (ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැදුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුමේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොත් අනුව රු.196,040,972ක් හා භාණ්ඩාගාර පොත් අනුව රු.197,181,641ක් විය. මෙයට හේතු වී තිබුණේ 2013 වර්ෂයේ සිට මේ දක්වා වර්ෂ 09 ක කාලයක් ඉකුත් වී තිබුණද නිරවුල් කර නොතිබුණු රු.1,150,694 ක් වූ නොසැසදුණු හර ශේෂය හා 2022 වර්ෂයේ දී පවරා නොගත් රු.10,000ක ණය ශේෂය හා අඩුවෙන් පවරා ගත් රු.25ක ණය ශේෂයකි. | විගණන නිරීක්ෂණ පිළිගන්නා බවත්, 2014 වර්ෂයේ සිට පැවත එන රු.1,197,132ක නොසැසඳුණු හර ශේෂයෙන් රු.46,438ක් අදාල විෂයභාර නිලධාරියාගෙන් අයකරගැනිමෙන් පසුව රු.1,150,693ක තවදුරටත් නොසැසදෙන හර ශේෂයක් ගිණුම්වල ඇති බව හා මෙම නොසැසඳුණු හර ශේෂය සොයා ගැනීමට ප්‍රමානවත් ලේඛන හා වාර්තා නොමැති බව. | භාණ්ඩාගාර පොත් හා දෙපාර්තමේන්තු පොත් අනුව වෙනසට අදාල සැසදුම් නොකළ ශේෂය කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. |

(ඇ) තැන්පතු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| --------------------- | --------------------- | ------------- |
| භාණ්ඩාගාර ප්‍රකාශය (SA - 30) අනුව තැන්පතු ගිණුම් ශේෂය රු.453,883,095ක් වුවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොත් අනුව එම ශේෂය රු.463,883,095ක් වූයෙන් රු.10,000,000ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එම වෙනසට පොදු තැන්පත් (පැරණි) ගිණුමේ 2022 දෙසැම්බර් 31 දිනට රු.10,000,000ක් වූ නිරවුල් නොකරන ලද හර ශේෂය හේතු වී තිබුණි. වර්ෂ 14 කට අධික කාලයක් ගතවී තිබුණද, මෙම වාර්තාවේ දිනය වනවිටත් නිරවුල් කිරීමට නොහැකි වී තිබුණි. | මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු අනාවරන කර ගැනීමට නොහැකිවී ඇති අතර ඊට අදාල උපදෙස් හා මග පෙන්වීම මත මෙම ගැටලුව නිරාකරනය කර ගැනීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යොමු කර ඇති අතර, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් උපදෙස් ලබා ගෙන ඉදිරි කටයුතු සිදු කරන බව. | තැන්පතු ගිණුම් හර ශේෂය කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. |

(ඈ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | | නිරීක්ෂණය<br>වටිනාකම | <br>අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| ------------------------ | | -------- | -------------------- | -------------- | -------------- |
| | | රු. | | | |
| (i) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 2008 පෙබරවාරි 6 දිනැති අංක 05/2008 දරන චක්‍රලේඛය | | ආයතනයක් විසින් පුරවැසි ප්‍රඥප්තියක් ක්‍රියාත්මක කිරීමේදී පුරවැසි ප්‍රඥප්තිය විධිමත්ව සකස් කිරීම, ප්‍රවර්ධනය කිරීම, සේවා යාවත්කාලීන කිරීම, පසු විපරම, ඇගයීම හා වැඩි දියුණු කිරීම යන පියවරයන් පසු කළ යුතු වේ. මොරටුව, හෝමාගම හා දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පුරවැසි ප්‍රඥප්තියක් සකස් කර තිබුණද උක්ත චක්‍රලේඛ විධි විධාන අනුව කටයුතු කර නොතිබුණි. | නිලධාරින්ට චක්‍රලේඛ විධි විධාන අනුව කටයුතු කිරිමට උපදෙස් දුන් බව | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2020 සැප්තැම්බර් 18 දිනැති අංක 16/2020 දරන ස්වදේශ කටයුතු චක්‍රලේඛයෙහි 10 ඡේදය | ප්‍රාදේශීය ලේකම්, සහකාර ප්‍රාදේශීය ලේකම් සහ පරිපාලන ග්‍රාම නිලධාරී විසින් සුදුසු පරිදි බෙදා වෙන්කරගෙන අවම වශයෙන් මාස 04කට හෝ වරක් සෑම ග්‍රාම නිලධාරී කාර්යාලයක්ම ආවරණය වන පරිදි පරීක්ෂාවට ලක් කිරීමට කටයුතු යෙදිය යුතු වුවද ඒ අනුව කටයුතු නොකළ අවස්ථාවන් මොරටුව, තිඹිරිගස්යාය, දෙහිවල සහ හෝමාගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලවලට අදාලව නිරික්ෂණය විය. | අවම වශයෙන් මාස 04කට හෝ වරක් සෑම ග්‍රාම නිලධාරී කාර්යාලයක්ම ආවරණය වන පරිදි පරීක්ෂාවට ලක් කිරීමට වර්තමානය වන විට සැලසුම් කර ඇති බව | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| -------------------------- | ---------------------------------- | -------------- |
| කොළඹ දිස්ත්‍රික් ලේකම් විසින් 2022 අගෝස්තු 05 දින ලිපි අංක DIST.CMB/ACC/2022 මගින් සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත නිකුත් කර තිබූ ලිපියේ දක්වා ඇති පරිදි අතිරේක දීමනා ලබා ගැනීමේදී නිත්‍ය දීමනාවන් එකකට වඩා ලබා ගන්නා ප්‍රතිලාභීන්ට, එක් නිත්‍ය දීමනාවක් වෙනුවෙන් පමණක් එක් අතිරේක දීමනාවක් ලබාදිය යුතු ලෙස දක්වා ඇත. නමුත් අතිරේක දිමනාව ලබා දිමේදි ඒ අනුව කටයුතු කර නොතිබුණෙන් තිඹිරිගස්යාය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අදාලව දිමනාව ද්විකරණය වූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව 446ක් හා එහි වටිනාකම රු.2,676,000ක් බව නිරික්ෂණය විය. | ද්විකරණ ගෙවීම් සංඛ්‍යාව 426 ක් බවද, එයට හේතු වූයේ පොරොත්තු ලේඛනගත සමෘද්ධිලාභී සංඛාව ඉවත් විය යුතු බැවිනි. මේ වන විට ද්විකරණ ගෙවීම් සිදු කර ඇති ප්‍රතිලාභීන්ගෙන් රු.2,152,000ක් අය කර ගෙන ඇති බව හා ඉතිරි මුදල්ද අයකර ගනිමින් පවතින බව | ද්විකරණ ගෙවීම් සිදු කර ඇති ප්‍රතිලාභීන්ගෙන් අය කරගැනිම් කඩිනමින් සිදුකළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්‍රියාකාරී සැලැස්මෙහි නිවාස 152 ක සූර්ය පැනල සවිකිරිම, තෝරාගත් විරැකියාවෙන් පෙලෙන කණ්ඩායම්වලට ස්වයං රැකියා පුහුණු පාඨමාලා 65ක් පැවැත්වීම, පුද්ගලයින් 1000කට පුහුණුව ලබාදීම, සතිපොළ 10ක් සංවර්ධනය කිරිම හා ක්‍රිඩා උපකරණ 2500ක ප්‍රමාණයක් ලබාදීම වැනි එකදු ක්‍රියාකාරකමක්වත් සමාලෝචිත වර්ෂය තුලදී ඉටුකර නොතිබුණි. | මෙම ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් ඉලක්ක 2022 වර්ෂය පුරා ඉටු කිරීමට ඉලක්ක ගතව ඉදිරිපත් කර ඇත. අංක 03/2022 හා 2022/04/26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛය අනුව රාජ්‍ය වියදම් පාලනය කිරීම සඳහා ඒ වන විට වැඩ හෝ ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර නොතිබූ සියලු ව්‍යාපෘති අත්හිටුවීමට උපදෙස් දී ඇත. ඒ අනුව, 2022 වර්ෂයේ පළමු කාර්තුව තුළ පමණක් ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරුණු අතර එහිදීද භාණ්ඩවල මිල සීග්‍රයෙන් ඉහළ යාම, සැපයුම්කරුවන් භාණ්ඩ සැපයීමට අපොහොසත් වීම වැනි අවස්ථාවන්ට මුහුණ දීමට සිදු විය. එම හේතුන් මත අපේක්ෂිත ඉලක්ක ඉටු කිරීමට නොහැකි විය. | ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් ඉලක්ක ලඟාකර ගැනිම සඳහා කටයුතු කළ යුතුය. නොවැලැක්විය හැකි සාධාරණ හේතු මත එය ඉටුකර ගැනිමට නොහැකි වන්නේ නම් විධිමත් පරිදි සැලැස්ම සංශෝධන කර අනුමත කර ගැනිමට කටයුතු කළ යුතුය. |

### 3.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හෝමාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා නව තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීමට කොන්ත්‍රාත් ආයතනයක් තෝරාගෙන තිබුණු අතර එහි ලංසු වටිනාකම රු.152,753,294ක් විය. එය ආයතනය විසින් ඉදිරිපත් කරන ලද රු.203,270,000ක්වූ ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා රු.50,516,706ක් අඩු වූ අතර ඒ සඳහා ලබා දුන් පැහැදිළි කිරීම්වලට පසුව එම ආයතනය සඳහා ඉදිකිරීම් | | |

| | | | |
|---|---|---|---|
| | කොන්ත්‍රාත්තුව පිරිනැමීමට අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව විසින් කොන්දේසි 02කට යටත්ව එනම් මූලික කොන්ත්‍රාත් මුදලින් සියයට 10ක් දක්වා කාර්යය සාධන සුරක්ෂණය ඉහළ දැමීම සහ කොන්ත්‍රාත් කාලය තුළ අධීක්ෂණ කටයුතු සමීපව සිදු කිරීමට යටත්ව අනුමැතිය ලබාදී තිබුණි. | | |
| (අ) | 2017 ජනවාරි 06 දින වැඩ ආරම්භකර දින 350ක කාලයක් තුල කොන්ත්‍රාත්තුව නිම කළ යුතු නමුදු 2018 පෙබරවාරි 28 දක්වා කොන්ත්‍රාත්තු කාලය දීර්ඝ කර තිබුණි. කෙසේ වුවද, කොන්ත්‍රාත්කරු 2018 මාර්තු සිට කොන්ත්‍රාත්තුව අතහැර දමා තිබිම මත 2018 ජූලි 31 දින එම කොන්ත්‍රාත්තු ගිවිසුම අවලංගු කර තිබුණි. එහෙත් කොන්ත්‍රාත්කාර සමාගමට එරෙහිව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.11.4 ප්‍රකාරව කටයුතු කර නොතිබුණ අතර අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව විසින් තිරණය කරන ලද පරිදි කොන්ත්‍රාත්කරුගේ ඉදිකිරිම් කාර්යයන් පිළිබඳව සමීපව අධීක්ෂණයක් කර නොතිබුණි | හෝමාගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම සම්බන්ධව ගිවිසුම් ගතව සිටි ආයතනය සමග ගිවිසුම 2018.07.31 දින අවලංගු කර ඇති බව සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 8.11.4 ප්‍රකාරව කටයුතු කිරිමට අදාල රේඛිය අමාත්‍යාංශ වෙත යොමු කර ඇති බව. | කොන්ත්‍රාත්කරුට එරෙහිව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු විම. |
| (ආ) | කොන්ත්‍රාත්තු ගිවිසුම අවලංගු කරන අවස්ථාව වන විට සමස්ත කොන්ත්‍රාත්තුවේ කාර්යයන්වලින් සියයට 20ක වැඩ ප්‍රමාණයක් පමණක් ඉටුකර තිබුණු අතර ඒ සඳහා ගතකළ කාලය දින 430ක් විය. ඒ අනුව දින 70ක දී සිදු කළ යුතු වූ වැඩ කොටස් වෙනුවෙන් දින 430ක් වැයකර තිබුණෙන් දින 360ක ප්‍රමාද කාලයක් සිදුව තිබුණද ඒ සඳහා ප්‍රමාද ගාස්තු ගණනය කර අයකර ගැනීම සිදු කර නොතිබුණි. | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද අවසාන වාර්තාව අනුව කොන්ත්‍රාත්තුවේ ගිවිසුම් පරිදි උපරිම සීමාව දක්වා ප්‍රමාද ගාස්තු අය කර ගැනීම නිර්දේශ කර තිබේ. | නිර්දේශ කර තිබෙන පරිදි ප්‍රමාද ගාස්තු අය කර ගැනීම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඉදිකිරීම් කටයුතු අතරමග නවතා දමන ලද මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීමේ වටිනාකම රු.147,418,009ක්වූ කොන්ත්‍රාත්තුව දෙවන කොන්ත්‍රාත්කාර සමාගමට 2021 අප්‍රේල් 21 දින සිට 2022 අප්‍රේල් 21 දක්වා දින 365ක කාලයකට ලබාදී තිබුණි. 2022 නොවැම්බර් 11 දින වන විට කොන්ත්‍රාත් කාලය අවස්ථා දෙකකදී දීර්ඝ කර තිබුණු අතර එම කොන්ත්‍රාත්කරු සඳහා වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් රු.22,053,602ක් ද ඇතුළුව රු.113,001,510ක් ගෙවීම් සිදුකර තිබුණි. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වෙන බව | ගිවිසුම් ප්‍රකාරව ඉදිකිරීම් කටයුතු ඉටුකරවා ගැනීම කළ යුතුය. |
| (ඈ) | මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2017 වර්ෂයේ ආරම්භ කර මේ දක්වා වසර 6ක කාලයක් ඉකුත්ව තිබුණු අතර කොන්ත්‍රාත්කරුවන් හට ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 120කට අධික මුදලක් ගෙවීම් සිදුකර තිබුණු නමුත් මේ දක්වා ගොඩනැගිල්ල භාවිතයට ගතහැකි තත්ත්වයට ඉදිකිරීම් කටයුතු අවසන්ව නොමැති බව නිරීක්ෂණය විය. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වෙන බව. | ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අප්‍රමාදව ඉටුකර භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය |

## 3.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 මාර්තු 16 දින ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය චක්‍රලේඛ අංක 04/2022හි 04 වන වගන්තියේ සඳහන් වන පරිදි මූල්‍ය | චක්‍රලේඛය ප්‍රකාරව ඇප තැන්පත් ලබාගැනීමටත්, විශ්‍රාම ගොස් ඇති නිලධාරීන්ගේ ඇප තැන්පතු | චක්‍රලේඛය විධිවිධාන ප්‍රකාරව ඇප තැන්පතු ලබා ගැනීමටත්, ඇප තැන්පතු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන |

| | | |
|---|---|---|
| වගකීම් දරනු ලබන නිලධාරීන් රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය ඇපකාර සංගමයේ හෝ ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ඉතිරිකිරීමේ ගිණුමක් ආරම්භ කොට මාස 03ක් ඇතුළත සම්පූර්ණ ඇප මුදල තැන්පත් කිරීමට කටයුතු කළ යුතු බව දක්වා තිබුණි. හෝමාගම හා මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාලව චක්‍රලේඛය ප්‍රකාරව ඇප තැබීම සිදු නොකිරීම, ඇප ලේඛන යාවත්කාලින නොකිරීම, ඇප තැන්පතුවලට අදාල ඉතිරි කිරීම් පාස් පොත්වල බැංකු ශේෂයන්ද යාවත්කාලීන නොකිරීම, ස්ථාන මාරු වී ගිය හා විශ්‍රාම ගොස් ඇති නිලධාරීන්ට අදාල ඇප තැන්පතු පාස්පොත් නිදහස් කිරීමට කටයුතු නොකිරීම නිරීක්ෂණය විය | නිදහස් කිරීමටත්, ඇප තැන්පත් ලේඛනය යාවත්කාලින කිරීමටත් නිලධාරීන්ට උපදෙස් දුන් බව. | යාමටත් කටයුතු කළ යුතුය. |

**3.4 පාඩු හා හානි**

| විගණන නිරීක්ෂණය<br>---------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>----------------------------------- | නිර්දේශය<br>------------- |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දින වන විට කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ගිනි ගැනීමෙන් සිදු වු හානියට වර්ෂ 10 කට අධික කාලයක් ගත වි තිබුණද මේ සම්බන්ධයෙන් පොලිස් විමර්ශණ අවසන් වී නොතිබුණෙන් එම හානි අයකර ගැනිම හෝ කපාහැරීම සිදුකළ නොහැකිව පැවතුණ අතර ගිනි ගැනීමෙන් සිදු වු පාඩුවේ වටිනාකම රු.92,606,688 ක් විය | මේ සම්බන්ධව පොලිස් විමර්ශන කටයුතු සිදු කර ඇති අතර සාර්ථක පිලිතුරක් නොලද හෙයින් ගොනුව කොට්ඨාශයේ ගොනු කර ඇති බව හා මෙම අලාභය කපාහැරීමේ හැකියාව පිළිබඳව උපදෙස් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවෙන් විමසා ඇති අතර අපරාධකරුවන් හඳුනා ගැනීමට ප්‍රථමයෙන් අලාභය කපා හැරීමට කටයුතු කිරීම තුලින් මේ වන විටත් පවත්වාගෙන යනු ලබන අපරාධ විමර්ශන කටයුතු අධෛර්යමත් විය හැකි බවත් පරීක්ෂණ කටයුතු කඩිනමින් නිමකර අපරාධකරුවන්ගෙන් අදාල අලාභය අය කර ගැනීමට අදාලව නීති කටයුතු කිරීම වඩාත් සුදුසු බව දැනුම් දි ඇත. | පාඩු හා හානි පිළිබඳව පරීක්ෂණ කඩිනමින් පවත්වා ඊට වගකිව යුතු නිලධාරීන්ට හා සේවකයන්ට එරෙහිව විනය කටයුතු හා රජයට සිදුවූ පාඩුව සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි සංග්‍රහයේ අංක 101 හා 156 රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව ඊට වගකිව යුතු පාර්ශවයන්ගෙන් පූර්ණය කර ගැනීමට හා අනතුරුව හානි නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.5 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ------------------------------------ | -------------- |
| (අ) | පරිවර්තන වැඩිපුර ගෙවීම් හේතුවෙන් රු1,514,127ක්ද, ද්විත්ව විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් හේතුවෙන් රු.5,841,700ක්ද, විශ්‍රාමිකයන් මියගිය පසු ඒ බව තහවුරු කර ගැනීමෙන් තොරව තවදුරටත් විශ්‍රාම වැටුප් ගෙවීම හේතුවෙන් රු.1,355,952ක්ද, ජීවන වියදම්, අන්තර් දීමනා හා පාරිතෝෂික වැඩිපුර ගෙවීම් රු.3,060,546ක් සහ වෙනත් හේතුන් මත රු.7,404,625ක් යනාදි වශයෙන් කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 13 කට අදාළ බල ප්‍රදේශයන්හි විශ්‍රාමිකයන්ට අවිධිමත් ලෙස විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවා තිබුණි. 2022 දෙසැම්බර් 31 දින වන විට විශ්‍රාමිකයන් 210 දෙනෙකුට එලෙස වැඩියෙන් ගෙවීම් කර තිබූ විශ්‍රාම වැටුප් වටිනාකම රු.19,176,950 ක් විය. | මෙම වැඩිපුර ගෙවීම්වලින් බොහොමයක් මාසික විශ්‍රාම වැටුපෙන් නැවත අය වෙමින් පවතින බව හා එම වැඩිපුර ගෙවීම් වාර්තා වීමට හේතු හඳුනාගෙන ඒවා වලක්වා ගැනීමට මේ වන විට පියවර ගෙන ඇති බව. | විශ්‍රාම වැටුප් නිවැරදි හා විධිමත් ලෙස සකසා ඒවා පරීක්ෂා කිරීමෙන් අනතුරුව විශ්‍රාම වැටුප් ගෙවීමටත් ජීවතුන් අතර සිටින විශ්‍රාමිකයන් වෙනුවෙන් පමණක් විශ්‍රාම වැටුප් ගෙවීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම හා වැඩිපුර ගෙවීම් ආපසු අයකර ගැනිමට කඩිනමින් කටයුතු කළ යුතුවිම. |
| (ආ) | කොළඹ, දෙහිවල, කොලොන්නාව, සහ කැස්බෑව යන ප්‍රාදේශිය ලේකම් කාර්යාල පවත්වාගෙන යනු ලබන ඉඩම්වල අයිතිය එම ප්‍රාදේශිය ලේකම් කාර්යාල සතු නොවූ අතර ඒවායේ අයිතිය | කොළඹ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉඩම, නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සංවර්ධන කටයුතු සඳහා හඳුනා ගෙන ඇති බව. කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිහිටි ඉඩම් කොටස ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙත පවරා දීම සඳහා බස්නාහිර | ඉඩම්වල නිරවුල් අයිතිය ලබා ගෙන පවරාගැනිමට අප්‍රමාදව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පවරා ගැනීම සඳහා මේ වන තෙක් විධිමත් පියවර ගෙන නොතිබුණි. | පළාත් ඉඩම් කොමසාරිස් විසින් නිර්දේශ කර ඇති බව<br>කොලොන්නාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉඩම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිහිටුවීම සඳහා අත්පත් කර ගත් ඉඩමක් බැවින් ඉඩම අත්පත් කරගත් අරමුණ හැර වෙනත් කාර්යයන් සඳහා යොදා ගැනීමට නොහැකි බැවින් දැනට එහි සිටින අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීම සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතින බව<br>දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිහිටි ඉඩමේ නිරවුල් භුක්තිය රජය වෙනුවෙන් දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත භාර දී ඇතත් දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව විසින් ඉදිරිපත් කර ඇති පැරණි සහ අපහැදිලි ඔප්පු හේතුවෙන් අධිකරණය විසින් ලබාදුන් නඩු තීන්දුව අනුව ඉඩමේ නිත්‍යානුකූල අයිතිය දෙහිවල ගල්කිස්ස මහනගර සභාව සතු බව. | |
| (ඇ) | 2016 ජුනි 21 දිනැති අංක CO/PDK/2010/679 දරන අනුරේඛණය සකස් කර ඇති පාදුක්ක ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ මීනිමරු දොළ රක්ෂිතයේ, රජයේ ඉඩම් ආඥා පනතේ ඉඩම් නියෝග 228 අනුව දොළ රක්ෂිතය වෙනමද, පුද්ගලයන් පදිංචි හා භුක්ති විඳින කොටස් වෙනමද, දැක්වෙන අනුරේඛණයන් සැකසීම සඳහා 2016/26 මැනුම් ඉල්ලීම මිනුම් අධිකාරී (කොළඹ) වෙත යොමු කර තිබුණි. නමුත් අදාල මැනුම් ඉල්ලීම සඳහා 2019 මාර්තු 23, 2020 | පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මීනිමරුදොළ රක්ෂිතයේ ඉඩම සඳහා අනුරේඛණයක් සැකසීම සඳහා 2016/26 මැනුම් ඉල්ලීම දිස්ත්‍රික් මිනින්දෝරු වෙත අදාල මිනුම් ඉල්ලීම සඳහා 2020.12.02 දින යොමු කල සිහි කැඳවීම් ලිපියට අනුව, එම ආයතනය විසින් මෙම මැනුම් ඉල්ලීම මිනින්දෝරු අධිකාරී - හෝමාගම වෙත 2021.01.08 දිනැතිව යොමු කර ඇත. මැනුම් සිදු කරමින් පසුව ඉදිරි කටයුතු සිදු කරන බව. | ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ප්‍රමාණවත් පරිදි ලිපි ඉදිරිපත් කර ඇති නමුත් අදාළ කාර්යය සිදු වී නොමැති බැවින් දිස්ත්‍රික් ලේකම්වරයාගේ ඍජු මැදිහත් වීමෙන් මිනුම්පතිවරයා දැනුම්වත් කර අදාළ කාර්යයන් ඉටු කරවා ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | මාර්තු 13 හා 2020 දෙසැම්බර් 02 දින සිහි කැඳවීම් ලිපි යොමුකර ඇතත් මෙතෙක් එම අනුරේඛණ සැකසීමේ කටයුතු සිදු කර නොතිබුණි. | | |
| (ඈ) | කොටබොඩවත්තේ පිහිටා ඇති රජයේ නිල නිවාසවලට අදාල කුලී ආදායම දිගු කාලයක් තිස්සේ අයකර ගෙන නොතිබූ අතර උසාවි නියෝගයට අනුවද කටයුතු කර නොතිබුණි | මේ සම්බන්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරා ඇති නඩුවේ සමථකරණයේදී ලබා දුන් මාණික්කාවත්ත ඉඩම වෙනුවට විකල්ප ඉඩමක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත පැවරීමට කටයුතු කරන ලෙස සීතාවක ප්‍රාදේශීය ලේකම් වෙතද, එම නඩුවේ සමථ ක්‍රියාමාර්ග ඉදිරියට ගෙන යාමට අදාල පියවර ගැනීම වෙනුවෙන් නිවාස සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ඉතා කඩිනමින් ලබා ගැනීමට සහ එය ක්‍රියාවට නැංවීමට කටයුතු කරන ලෙස ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරී වෙතද දන්වා ඇති බව. | නිල නිවාසවල පදිංචි වී සිටින කුලී නිවසියන් සම්බන්ධ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------------- | ------------------------------------------ | --------------- |
| තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගෙන තිබුණු බවට 2022 වර්ෂයේ වාර්ෂික කාර්යසාධන වාර්තාවේ තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය යටතේ අංශ 31 කට අදාලව තිරසාර සංවර්ධන අරමුණු 14 ක් යටතේ දර්ශක 225ක ප්‍රගතිය දක්වා තිබුණු අතර එයින් දර්ශක 54ක ප්‍රගතිය සියයට 50කට වඩා පහල අගයක පැවතුණි. | ප්‍රගතිය ළඟා කරගැනීමට අපොහොසත් වී ඇති බව. | තිරසර සංවර්ධනය උදෙසා තිරසර සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීමට කටයුතු කළ යුතුය. |

## 5. යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අභ්‍යන්තර විගණන අංශයට අදාලව 2022 දෙසැම්බර් 31 දිනට තත්‍ය කාර්ය මණ්ඩලය ප්‍රධාන අභ්‍යන්තර විගණක, සංවර්ධන නිලධාරීන් 07 ක හා කළමනාකරණ සේවා නිලධාරියෙකුගෙන් සමන්විත විය. සමාලෝචිත වර්ෂය තුලදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක විගණන පරීක්ෂණවලට අදාලව විගණන විමසුම් 21ක් නිකුත් කර තිබුණු අතර එය විගණන සැලැස්මට අනුව අපේක්ෂිත ප්‍රමාණයෙන් සියයට 25ක් පමණක් විය. තවද, සමාලොචිත වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07ක විගණන කටයුතු සිදුකර නොතිබුණි. | කෝවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් රජයේ ආදායම් අඩු වීම, විදේශ විනිමය ගැටළුව හේතුවෙන් ඉන්ධන ආනයනය සීමා කිරීම, ඉන්ධන භාවිතයේදී අරපිරිමැස්මෙන් කටයුතු කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 4/2022 අනුව උපදෙස් ලබා දීම, ඉන්ධන සපයා ගැනීමේ ගැටලුකාරී තත්ත්වය හේතුවෙන් පොදු හා පෞද්ගලික සේවා නිසි පරිදි ක්‍රියාත්මක නොවීම, රජයේ නිලධාරීන්ට සේවය සඳහා වාර්තා කිරීමේදී දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදු වීම, රජයේ නිලධාරීන් කැඳවීම සීමාකිරීම වැනි හේතු නිසා ඉලක්ක කරා යාමට නොහැකි වූ බව. | විගණන සැලැස්මට අනුව කටයුතු කළ යුතු අතර අපේක්ෂිත ලෙස එය ඉටුකර ගැනීමට නොහැකිවන්නේ නම් විධිමත් පරිදි එය සංශෝධනය කර අනුමත කරගැනීමට කටයුතු කළ යුතුය. |

## 6. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනුමත සේවක සංඛ්‍යාව 1,423ක් ද, තත්‍ය සේවක සංඛ්‍යාව 1,571ක් ද, පුරප්පාඩු සේවක සංඛ්‍යාව 282ක් හා අතිරික්ත සේවක සංඛ්‍යාව 430ක් විය. සංවර්ධන නිලධාරි සේවයේ අනුමත තනතුරු සංඛ්‍යාව 107ක් වුවද එම සේවයේ තත්‍ය සේවක සංඛ්‍යාව 537ක් වූයෙන් අතිරික්ත සේවක සංඛ්‍යාව 430ක් විය. පුරප්පාඩු සේවක සංඛ්‍යාව තුල රාජ්‍ය | රැකියා විරහිත උපාධිධාරීන් රැකියා ගත කිරීමේ වැඩසටහන යටතේ බඳවාගෙන රාජ්‍ය ආයතනවලට පුහුණුවට යොමු කළ සංවර්ධන නිලධාරීන් ස්ථිර සේවයට පත් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇති අතර රාජ්‍ය පරිපාලන පලාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය උපදෙස් අනුව කිසිදු නිලධාරියකුට අතිරික්ත නිලධාරීන් ලෙස සලකා කටයුතු නොකර ආයතන වෙත අනුයුක්ත | පවතින කාර්ය මණ්ඩලය අඛණ්ඩව කාර්යක්ෂම සේවයක් ලබාදීමට ප්‍රමාණවත් නම් අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමටද, නැතහොත් අදාල පුරප්පාඩු පිරවීමටද කටයුතු කල යුතුයි. |

| | |
|---|---|
| කළමනාකරණ සේවයේ තනතුරු පුරප්පාඩු 98 ක් හා ග්‍රාම නිලධාරී තනතුරු පුරප්පාඩු 98ක් නිරීක්ෂණය වුයෙන් එය මහජනතාවට සපයන සේවාවන්හි කාර්යක්ෂමතාවයට හා ඵලදායීතාවයට අහිතකර ලෙස බලපෑ හැකිය. | කර ඇති සියලුම නිලධරයන්ට රාජකාරී භාරගැනීමට අවස්ථාව සලසා දීම හේතුවෙන් සංවර්ධන නිලධාරින් 430ක අතිරික්තයක් ඇතිවීම.<br>ග්‍රාම නිලධාරන් බඳවා ගැනීමේ තරඟ විභාගය 2021.05.27 දින ගැසට් පත්‍රයේ පල කර ඇතත් කෝවිඩ් ව්‍යවසනය හමුවේ විභාග කල් දැමීමට සිදු විම. කෙසේ වුවද, පුරප්පාඩු සම්බන්ධව රාජකාරී ඉටුකිරීම හෝ වැඩ බැලීමේ පත්වීම් ලබා දීම තුලින් මහජනතාවට සපයන සේවාවන් කාර්යක්ෂමව හා ඵලදායිව සිදු කිරීමට කටයුතු කර ඇති බව. |